# මැතිවරණ දෙපාර්තමේන්තුව
# தேர்தல்கள் திணைக்களம்


පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426
web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත, රාජගිරිය (10107)
தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)


මගේ අංකය: DE/LI/04/2015(PE) ඔබේ අංකය : දිනය: 2015.07.04
எனது இல. உமது இல.. திகதி :

01. පාර්ලිමේන්තු මහ මැතිවරණයට තරඟ කරන සියලුම දේශපාලන පක්ෂවල ලේකම්වරුන්,
02. සියලුම කැබිනට් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන්,
03. දැනට විසුරුවා ඇති හත්වන පාර්ලිමේන්තුව නියෝජනය කළ සියලුම මන්ත්‍රීවරුන්,
04. පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරුන්, අමාත්‍යවරුන් ඇතුළු පළාත් සභා මන්ත්‍රීවරුන්,
05.පළාත් පාලන ආයතන ප්‍රධානීන් සහ නියෝජිතයන් ඇතුළු ප්‍රාදේශීය ප්‍රමුඛ දේශපාලන ක්‍රියාකාරීන් වෙත

.................................................................මහතා, .................................................
(පක්ෂයේ නම)
..........................................................................
..........................................................................

ප්‍රිය මහත්මයාණෙනි/ මහත්මාවනි,

**පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2015 අගෝස්තු 17**
**නාමයෝජනා කාල සීමාව ඇතුළුව ඡන්ද විමසීම් කාලසීමාව තුළ මහජන පෙළපාලි/ පෙරහැර හෝ රථ පෙළපාලි පැවැත්වීමෙන් වැළකී සිටීමේ අවශ්‍යතාව හෙවත් ඡන්ද විමසීමේ නීතිය උල්ලංඝනය නොකිරීමේ අවශ්‍යතාව**

දැනට නාමයෝජනා කැඳවා ඇති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ඔබගේ පක්ෂය ඉදිරිපත් වීමට නියමිත හෙයින් ඡන්ද විමසීම් නීති උල්ලංඝනය කිරීමෙන් හෙවත් ඡන්ද නීති නොසලකා ක්‍රියා කිරීමෙන් වැළකීමේ අවශ්‍යතාව පිළිබඳව ඔබගේ පක්ෂයේ ඡන්ද කොට්ඨාස මට්ටමේ නියෝජිතයා වන ඔබ දැනුවත් කිරීමටත්, ඡන්ද නීති ආරක්ෂා කර ගැනීම සඳහා ඔබගේ සහාය ඉල්ලා සිටීමටත් මෙම ලිපිය ඔබ වෙත එවනු ලැබේ.

**02. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධිවිධානවලට අනුව නාමයෝජනා භාර ගැනීම ආරම්භ වූ දිනයේ සිට ඡන්ද විමසීම් ප්‍රතිඵල ප්‍රකාශ කිරීමෙන් පසු සතියක් ඉකුත් වන තෙක් ආගමික හෝ සමාජයීය නොවන පෙරහැර, පෙළපාලි යනාදිය පැවැත්වීම නීති විරෝධී ය. එනම් එකී පනත මගින් දේශපාලනමය ප්‍රවර්ධන පෙළපාලි/ පෙරහැර පැවැත්වීම තහනම් කර තිබේ. එබැවින් මෙම කාලසීමාව තුළ පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා නැතහොත් දේශපාලන පක්ෂ/ අපේක්ෂකයන් සතු ජන බලය ප්‍රදර්ශනය කිරීම සඳහා කිසිදු ආකාරයක මහජන පෙළපාලි/ පෙරහැර හෝ රථ පෙළපාලි, පාපැදි/ යතුරුපැදි සංචාර පැවැත්වීමට අනුබල නොදෙන ලෙස, එවැනි ක්‍රියාවලට සහභාගී නොවන ලෙස හා එවැනි නීති විරෝධී කාර්යයන් වැළැක්වීමට සහාය ලබා දෙන ලෙස ඔබෙන් කාරුණිකව ඉල්ලමි. නාමයෝජනා භාරදීමේ කාලසීමාව තුළ හෝ ඉන්පසුව රථ පෙළපාලි/ බයිසිකල් රැළි/ මහජන පෙළපාලි සංවිධානය කිරීමෙන් හෝ ඒවාට සහභාගි වීමෙන් වැළකී සිටින ලෙස කාරුණිකව දන්වා සිටිනු ලැබේ.**

03. විශේෂයෙන්ම මෙම මැතිවරණ ප්‍රචාරණ කාලසීමාව තුළ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය පැවැත්වෙන හෙයින් එම විභාගවලට පෙනී සිටිනා දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා කිසිදු ආකාරයක බාධාවක් නොවන සේ ක්‍රියා කිරීමේ අවශ්‍යතාව ඔබගේ කාරුණික අවධානයට යොමු කර සිටිනු රිසියෙමි. මෙයට පෙර පැවති පළාත් සභා ඡන්ද විමසීම් වලදී අදාළ ඡන්ද විමසීම් කාලයීමාවේ දී දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන් විසින් සිදු කරනු ලැබූ නීති විරෝධී ඡන්ද ප්‍රචාරක කටයුතු නිසා විභාගයට පෙනී සිටි සිසු දරුවන් දැඩි අපහසුතාවලට මුහුණ දෙන ලද අතර, ඔවුන්ගේ විභාග කටයුතුවලට ඉමහත් බාධා ඇති විය. එබැවින් මෙම පාර්ලිමේන්තු මහ මැතිවරණ කාලසීමාව තුළදී කිසිදු විභාග අපේක්ෂකයකුට බාධාවන ලෙස දේශපාලන පක්ෂ හෝ අපේක්ෂක ප්‍රවර්ධන කටයුතු, පෙළපාලි යාම, රැස්වීම් පැවැත්වීම යනාදිය පැවැත්වීමෙන් වළකින ලෙස හා ඔබගේ පක්ෂයේ කිසිදු ක්‍රියාකාරිකයකුට / ආධාරකරුවකුට එවැනි නීති විරෝධී කටයුතුවල නිරත වීමට ඉඩ නොදෙන ලෙස කරුණාවෙන් ඉල්ලමි.

04. නාමයෝජනා කාලසීමාව තුළ කිසිදු අයුරකින් පෙළපාලි යාම්, රැස්වීම් පැවැත්වීම්, ප්‍රචාරක කටයුතු සිදු කිරීම් වැනි ඡන්ද විමසීම් නීතිය උල්ලංඝනය වන ආකාරයේ ක්‍රියාවන් සිදු නොකිරීමට ඔබ පක්ෂයේ සියලු අපේක්ෂකයන්, ආධාරකරුවන් ඇතුළු සියලු දේශපාලන ක්‍රියාකාරීන් දැනුවත් කිරීමට ඔබ ක්‍රියා කරනු ඇතැයිද, එවැනි නීති විරෝධී ක්‍රියා වැළැක්වීමට පොලීසියට උපරිම සහාය ලබා දීමට ඔබ කාරුණික වනු ඇතැයිද ඉතා ඕනෑකමින් අපේක්ෂා කරමි.

05. යම් ලෙසකින් නීති විරෝධී ලෙස මහජන පෙළපාලි, පෙරහැර හෝ බයිසිකල් රැළි, රථ පෙළපාලි පැවැත්වීමට හෝ මැතිවරණ නීති (රටේ සාමාන්‍ය නීති) උල්ලංඝනය කිරීමට කිසියම් දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන් උත්සාහ කළහොත් ඔවුනට එරෙහිව කිසිදු ලිහිල් කිරීමකින් තොරව තදින් නීතිය ක්‍රියාත්මක කරන ලෙසට ද පොලිස් දෙපාර්තමේන්තුවට උපදෙස් දී ඇති බව කාරුණිකව සලකනු මැනවි.

06. තවද, උසස් පෙළ විභාගය පැවැත්වෙන ස්ථානයන් හිදී එකී විභාග ශාලාවල කටයුතුවලට බාධා විය හැකි අයුරින් රැස්වීම්, අත්පත්‍රිකා බෙදාහැරීම් ප්‍රචාරක කටයුතු සිදු කිරීමෙන් වැළකී සිටින ලෙස ද සියලුම දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

07. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා නාමයෝජනා දැන්වීම නිකුත් කළ දිනයේ සිටම ඡන්ද විමසීමට අදාළ නීතිවලට හා දිවයිනේ සාමාන්‍ය නීතිවලට අනුකූලව සියලුම දෙනා ක්‍රියාකිරීම අත්‍යවශ්‍ය බැවින් පාර්ලිමේන්තු මහ මැතිවරණය නිසි ලෙස, නිදහස්ව හා සාධාරණව පැවැත්වීම සඳහා ඉහත සඳහන් ඉල්ලීම්වලට අනුකූලව ක්‍රියා කිරීමෙන් සහාය ලබා දීමට කාරුණික වනු මැනවි.

**මහින්ද දේශප්‍රිය**
**මැතිවරණ කොමසාරිස්**

පිටපත් :- 1. පොලිස්පති
2. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) } දැනගැනීම පිණිස හා ක්‍රියා කිරීම පිණිස කරුණාවෙනි.
3. විභාග කොමසාරිස් ජනරාල් - කාරුණික දැනගැනීම පිණිස ය.
4. මැතිවරණ පැමිණිලි විමර්ශනය සඳහා වූ ස්ථාවර කමිටුවේ දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයින් } දැනගැනීම පිණිස හා ක්‍රියා කිරීම පිණිස, කරුණාවෙනි.
5. විධායක අධ්‍යක්ෂවරු, දේශීය මැතිවරණ නිරීක්ෂණ සංවිධාන - කාරුණික දැනගැනීම පිණිස ය.